කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2013
(නව නිර්දේශය)
2016 අගෝස්තු - ඔක්තෝබර්

මානවශාස්ත්‍ර පීඨය

**සිංහල - SINH - E 3015**

චිරන්තන සිංහල පද්‍ය කාව්‍ය හා විචාර කලාව

**පළමු කොටසේ පළමුවන ප්‍රශ්නයත්, දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක (02) බැගිනුත් තෝරා ගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

I කොටස

01. (අ) පහත දැක්වෙන ගීවල අර්ථ ලිහිල් බසින් ලියන්න.

ස්වස්ති
නොදෙයි කෙසෙයි සිතෙයි - කළ යහ ගී අසා මෙය්
බෙයන්ද්හි රන්වනන් අතලු - දෙපෙති මහනෙල් මලින් මල්
ඔජලු ගී

ගැහැනී ලියක් බෙයන්ද්හි - රන්වනුන් අතරෙ
මන ම තමහට් මෙ ගත් - හත්හි මල්දම් අතින් මැඩැලැ
ඔජලම් ගී

ස්වස්ති
බෙයද්හි අද්හයි ආ - දුන් සිත සෙ මෙ ගැහැනි
ලියක් ඇති මන ම - නැයුළ වීද ලබූ යුක් ගත් වි
කිත් සෙන් පව්ජන් ගී ගලව් රියන් මි (ලකුණු 10 යි.)

(ආ) පහත දැක්වෙන ගීවල අර්ථ ලිහිල් බසින් ලියන්න.

පබවත ගලත ගලත - සොමි වුවනත දිස්නා
මිණි මුතු පියුම් සිරි හා - වෙනසක් නොදත් බිඟු රජ

පහළ පියවුරුනි - සසල විල් සිලිල්හි බිජු
වැළහි සපුසල් සෙන් නා - බිය දනවී පුර පියන්

පියවුරුනි තො උකහා - පිහිතත උඩු මුව වුවන්
කලක් පියුමැයි බිඟුනෙත් - කිම්ද ගන ගැබ විදු පෑ

(ලකුණු 10 යි.)

(ඇ) පහත දැක්වෙන පද්‍යවල අර්ථ ලිහිල් බසින් ලියන්න.

| | |
|---|---|
| නඳ දෙන ලෙව් නුවන් නව සඳ | කලාවන් |
| දෙන තිළිණෙන් සිව් දිව් වැසි | වලාවන් |
| මුනි බණ කෙසර තෙල් යුතු රන | මලාවන් |
| දූන ගති මෙ හිමි ලොව සුසැට | කලාවන් |
| | |
| අරුණු සරණ කල ගජවන් ගමන් | යුතු |
| කමල් කල් වුවන් රස පිය බස් | නු මු තු |
| විදුරව් නුවණ සොම් ගුණ මෙ තිරිඳු | දි මු තු |
| සව්දෙව් රුසිරි එක තැන මැවු වැනි | අ මු තු |
| | |
| හෙ සඳ ! කිම මුහුද ! කිම සැඟ වෙනු | වෙලත |
| මෙ ගජ හය අතින් පැරකුම් රජු | දිමුත |
| දෙයි ගිජිඳුන්, ඔහු මඳ හස කර | ලවත |
| තඳුන් කැලුම් සොම් ගුණ යුතු පඬුරු | ඇත |

(ලකුණු 10 යි.)

(ඇ) පහත දැක්වෙන පද්‍යවල අර්ථ ලිහිල් බසින් ලියන්න.

| | |
|---|---|
| සරා සලෙලු දන | සතො සේ |
| සුරා පාන කරන | ලෙ සේ |
| පුරා අවුලු නොයෙක | ර සේ |
| සරා අවන් හල් | සහ සේ |
| | |
| සුරඟන රඟ රඟ | හ ළු වෝ |
| දුටු දන මන නෙත් | වෙ ළු වෝ |
| මනයොන සර කුසුම | ළු වෝ |
| තැන තැන රඟ දෙති | න ළු වෝ |
| | |
| රැගත් සුරා පිරූ | විතින් |
| සුරත් තඹුරු පෙති සෙ | නෙතින් |
| පුවත් නොදන බමන | ගතින් |
| නටත් අයෙක් සුරා | මතින් |

(ලකුණු 10 යි.)

II කොටස

02. සීගිරි පද්‍යවලින් විශද වන ප්‍රතිභා පූර්ණ කවිත්ත්වය සනිදර්ශන ව පහදන්න.

03. "මුවදෙව් දා වත, සස දා වත යන ගී කාව්‍යද්වයෙන් පොළොන්නරු යුගයේ සිංහල පද්‍ය සාහිත්‍යය දීප්තිමත් විය." විමසන්න.

04. "සිංහල පද්‍යාවලියේ මුදුන් මල්කඩ කව්සිළුමිණ යි." මේ ගැන ඔබේ අදහස් දක්වන්න.

05. ඒක පුද්ගල වර්ණනයක දී උද්ගත වන ඒකාකාරිත්වය නැති කිරීම සඳහා **පැරකුම්බා සිරිත්** කවියා විසින් උපයුක්ත විවිධ කාව්‍යෝපක්‍රම පැහැදිලි කරන්න.

06. ''වෑත්තෑවේ හිමියන්ගේ භාෂා නෛපුණ්‍යය හා වර්ණනා චාතුර්යය **ගුත්තිල කාව්‍යයෙන්** මැනවින් පිළිබිඹු වේ.'' සාකච්ඡා කරන්න.

## III කොටස

07. ''කාව්‍ය ශෝභා කරාන් ධර්මාන් - අලංකාරාන් ප්‍රචක්ෂතෙ.'' මේ ප්‍රකාශනය පැහැදිලි කොට අලංකාර වාදය ගැන හැඳින්වීමක් කරන්න.

08. වාච්‍යාර්ථ, ලක්ෂ්‍යාර්ථ හා ධ්වන්‍යාර්ථ සනිදර්ශන ව පහදන්න.

09. උද්දේශය, භාවාකල්පය, ස්වරය, අභිප්‍රාය යන විචාරාංගයන් නිදසුන් සහිත ව විභාග කරන්න.

10. ''ප්‍රායෝගික විචාරය බිහි වී ඇත්තේ කෙටි පද්‍ය කාව්‍ය විවේචනය පාදක කොටගෙනය.'' මේ ගැන ඔබේ අදහස් දක්වන්න.

( 2 - 10 දක්වා ලකුණු 15 බැගිනි.)